SLGURU.LK

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 12 | විෂයය Subject: **නාට්‍ය හා රංගකලාව - I** | කාලය Time: පැය 03 |

නම : ..............................................................................

- **උපදෙස් :**

I කොටස සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

II කොටස - A සහ B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

- නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

01. ''නාට්‍ය යනු ලෝකයේ සුඛ දුක්ඛ යන දෙකෙන් ම යුක්ත වූ යම් ස්වභාවයක් පවතී ද එය අංග ආදී අභිනයෙන් ප්‍රකාශ කිරීමයි.'' යනුවෙන් පැවසුවේ කවරෙක් ද ?
    1) භරතමුනි  2) ධනංජය  3) අභිනගුප්ත
    4) විශ්වනාථ  5) භට්ටලොල්ලට (..........)

02) ''නෘත්‍ය'' යන්නට වඩාත් ගැළපෙන වරණය තෝරන්න.
    1) නෘත්‍යයෙහි ඇත්තේ අර්ථ විරහිත රිද්මයකි.
    2) නෘත්‍ය යනු රිද්මයානුකූල අංග චලනයයි.
    3) උඩරට නර්තනයෙහි නෘත්‍ය බහුල වශයෙන් අන්තර්ගතය.
    4) නෘත්‍ය යනු නෘත්ත යන්නට පර්යාය පදයකි.
    5) ආංගික සහ සාත්ත්වික අභිනය මගින් කිසියම් භාවයක් ප්‍රකට වන නර්තනයකි. (..........)

03) කලාව පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැදි ප්‍රකාශය තෝරන්න.
    1) කලාව දෙවියන් ගේ නිර්මාණයකි.
    2) කලාව පිළිබඳ විවිධ නිර්මාණ පැවතිය ද පොදු එකඟතාවයක් නැත.
    3) කලාව හා ශිල්ප වශයෙන් කෙරෙන වර්ගීකරණයට පදනමක් නැත.
    4) ස්වභාව සෞන්දර්යය හා කලාව යනු එකම දෙයකි.
    5) සියලුම කලා මුළුමනින් ම දෘෂ්ටිගෝචර ය. (..........)

04) ලෝකධර්මී ශෛලියේ ලක්ෂණ ඇතුත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
    1) ලෝකයෙහි සිදුවන යමක් වේදිකාව මත ඒ අයුරින්ම සිදුකිරීම.
    2) ලාලිත්‍යයෙන් යුතු අංග චලනයෙන් යුක්ත වීම.
    3) කාලීන ප්‍රවෘත්තියක් වස්තු විෂය වශයෙන් නොතෝරා ගැනීම.
    4) අංග රචනය හා රංගාලෝකයට උපරිම ඉඩක් සැලසීම.
    5) පසුතල හා නාට්‍යෝපකරණ අවම වශයෙන් උපයෝගී කරගැනීම. (..........)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

05) සාත්වික අභිනය පමණක් අඩංගු වරණය තෝරන්න.

1) අශ්‍රු, ප්‍රලය, ස්තම්භ, ස්වරභංග, වේපථු
2) හස්ත, අපවාරිත, වේපථු, රෝමාංච, ජඩතා
3) වෛවර්ණ, ප්‍රලය, ස්වේද, රෝමාංච, ග්ලානි
4) වේපථු, චාරි, ගද්ගද, ප්‍රලය, ස්වේද
5) ප්‍රලය, චාරි, ග්ලානි, ජඩතා, අපවාරිත (..........)

06) ආංගික අභිනයට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.

1) ඉදිරියට පැමිණවීම යන අර්ථය දෙයි.
2) ප්‍රස්ත, අලංකාර, අංග රචනා හා සජ්ජීම ආංගික අභිනයට අයත් වේ.
3) නළු-නිළි වේදිකාවේ සිටගන්නා ක්‍රමයයි.
4) හස්ත හා පාදවල සංයෝගයයි.
5) නළුවා අංග, ප්‍රත්‍යංග හා උපාංග මගින් අදහස් පළකිරීමයි. (..........)

07) ආහාර්ය අභිනය පිළිබඳ නිවැරදි වරණය තෝරන්න.

1) අංග රචනය ආහාර්ය අභිනයට අයත් නොවේ.
2) ආහාර්ය අභිනය වැදගත් වන්නේ නාට්‍යධර්මී ශෛලීය ය.
3) ආහාර්ය අභිනය නළු නිළියන් හඳුනාගැනීමට උපකාරී වේ.
4) නාට්‍යයේ ශෛලිය ආහාර්ය අභිනයට අදාළ නො වේ.
5) චතුර් අභිනයෙන් අවම වශයෙන් වැදගත් වන්නේ ආහාර්ය අභිනයයි. (..........)

08) වාචික අභිනය සම්බන්ද නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1) වාචික අභිනයෙන් තොර ප්‍රාසාංගික කලාවෙක් පැවතිය නොහැකි ය.
2) වාචික අභිනයට අයත්වන්නේ සංවාද පමණි.
3) ජනාන්තික, අපවාරික හා ප්‍රකාශ භාෂණ ආදී භාෂණ විධි වාචිකාභිනයට අයත් නොවේ.
4) නාට්‍යධර්මී සම්ප්‍රදායේ දර්ශන, පසුතල ආදිය මවාපාන්නේ වාචික අභිනයෙනි.
5) ලෝකධර්මී සම්ප්‍රදායේ වාචිකාභිනයට වැදගත් තැනක් හිමි නොවේ. (..........)

09) නාට්‍යධර්මී නාට්‍යයක ලක්ෂණයක් නොවන්නේ,

1) ලොව සිදුවන යම් දෙයක් පාත්‍රයන් විසින් මූර්තිමත් ලෙස චිත්තාකර්ෂණීය ලෙස නාට්‍යයට ඉදිරිපත් කරනු ලැබීම.
2) පර්වත, යාන, විමන්, පලිස්, සන්නාහ ආයුධ ද්වන්ධ සටන් මූර්තමත් ලෙස ඉදිරිපත් නොකිරීම.
3) එක් භූමිකාවක් රඟපෑමෙන් පසු වෙනත් භූමිකාවක් රඟපෑමට හැකිවීම.
4) ලාලිත්‍යයෙන් යුතු අංග වින්‍යාසයෙන්, වඩා පියවර තබමින් නැටීම හා ගමන් කිරීම.
5) සියලු අභිනය අලංකාර අංග විලාසයෙන් යුතුව ඉදිරිපත් කිරීම. (..........)

10) නාට්‍ය සංගීතය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

1) සංගීතය සාත්වික අභිනයට අයත් වේ.
2) මිනිස් හඬ පමණක් නාට්‍යයක සංගීතයට යොදාගැනීම අනුචිත ය.
3) සංගීතය යොදා නොගෙන වුව ද නාට්‍ය නිෂ්පාදනය කළ හැක.
4) එදිනෙදා භාවිත සංගීතය හා නාට්‍ය සංගීතය අතර වෙනසක් නැත.
5) ගායන වාදන හඬ පමණක් සංගීතය සේ සැලකේ. (..........)

11) ශෛලිගත සම්ප්‍රදායට අනුව නිර්මාණය වූ නාට්‍ය ඇතුලත් වරණය තෝරන්න.

1) ලෝමහංස, හරිම බඩු හයක්, මූදු පුත්තු
2) මූදු පුත්තු, මනමේ, මගුල් ප්‍රස්තාව
3) ලෝමහංස, මූදුපුත්තු, තලමල පිපිලා
4) මනමේ, සිංහබාහු, ගුරුතරුව
5) ලෝමහංස, රත්තරං, වෙල්ලවැහුම් (..........)

12) නෘත්ත, නෘත්‍ය, නාට්‍ය සංකල්පය පිළිබඳ නිවැරදි අර්ථ නිරූපණය ඇතුළත් ප්‍රකාශය වන්නේ,

1) නෘත්‍යයෙන් කිසිදු භාව ප්‍රකාශනයක් සිදු නොවේ.
2) නෘත්‍ය යනු රිද්මයානුකූල ගාත්‍රා වික්ෂේපයක් පමණි.
3) නාට්‍ය නෘත්‍ය තරම් ප්‍රබල නැත.
4) භරතමුනි මූලිකත්වය දුන්නේ නෘත්ත සම්බන්ධයෙන් පමණි.
5) නාට්‍යයට නෘත්ත හා නෘත්‍යයේ සහය අවශ්‍යය නැත. (..........)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

13) නාට්‍ය ශාස්ත්‍රයට අනුව ස්ථායිභාව ගණන,

1) හතකි. 2) අටකි. 3) හයකි 4) පහකි. 5) හතරකි. (........)

14) නාට්‍යයක අත්‍යවශ්‍යම අංගය වනුයේ,

1) අධ්‍යක්ෂ, නළුවා, රංග වස්ත්‍ර 2) නාට්‍ය පෙළ, නළුවා, ප්‍රෙක්ෂකයා

3) පසුතල නිර්මාණ, නළුවා, වේෂභාෂණ 4) රංග වස්ත්‍රාභරණ, අංග රචනය, නාට්‍ය පෙළ

5) රංග වස්ත්‍ර, ආලෝකය, ප්‍රේක්ෂකයා (..........)

15) වර්ණ සතරටම සහභාගී වියහැකි ලෙස නිපැයූ වේදය කුමක්ද ?

1) ඍග් 2) සාම 3) නාට්‍ය 4) යජුර් 5) අථර්ව (..........)

16) සති පිරිතක අවසන් අංගය වශයෙන් පවත්වනු ලබන බෞද්ධ පුණ්‍යකර්මය වනුයේ,

1) මිලින්ද ප්‍රශ්නය 2) යුගාසන බණ 3) සති පිරිත 4) සූවිසි විවරණ 5) ආලවක දමනය (..........)

17) ගදුහයා හා භික්ෂූන් වහන්සේ අතර ඇතිවන සංවාදයෙන් හා නාට්‍යමය අවස්ථාවක අන්තර්ගත පූජා කර්මය වනුයේ,

1) මිලින්ද ප්‍රශ්නය 2) යුගාසන බණ 3) සති පිරිත 4) සූවිසි විවරණ 5) ආලවක දමනය (..........)

18) භික්ෂූන් දෙනමක් විසින් පවත්වනු ලබන නාට්‍යමය ලක්ෂණ සහිත බෞද්ධ පූජා කර්මය කුමක්ද ?

1) මිලින්ද ප්‍රශ්නය 2) යුගාසන බණ 3) සති පිරිත 4) සූවිසි විවරණ 5) ආලවක දමනය (..........)

19) ආලවක දමනය නම් බෞද්ධ පූජා කර්මයෙහි අන්තර්ගත චරිතය කුමක්ද ?

1) දේවදූතයා 2) ගදුහ 3) මිලිඳු රජු 4) දේශනාවාදීහු 5) බහුභූතයා (..........)

20) කොහොඹා කංකාරියේ එන උෟරා යක්කමේ උෟරෙකුගේ වේශයක් ගෙන සිටින්නේ කවරෙක්ද ?

1) වලස් රජු 2) රාහු අසුරේන්ද්‍රයා 3) මිලිඳු රජු 4) දේශනාවාදීහු 5) බහුස්‍රැතයා (..........)

21) රිද්දි යාගය ආරම්භ වන්නේ,

1) හැන්දෑ පිදේනියෙනි. 2) දොළහ පෙළපාලියෙනි. 3) අටමගල තීන්දුවෙනි

4) කපුයක්කාරියෙනි. 5) වියන් රෙද්ද පෙළපාලියෙනි. (..........)

22) පත්තිනි හා කාලි පලඟ සොයා යාම නිරූපණය වන කවි ගායනය කවර අන්තර් රංගයේ කොටසක් ද ?

1) මී බන්ධණය 2) අඹ විදමන 3) මරා ඉපැද්දීම

4) ඇත් බන්ධණය 5) රාම මැරීම (..........)

23) මහා සම්මත රජුගේ බිසව වුත්, විෂ්ණු දෙවියන්ගේ සොහොයුරිය වුත් මැණික්පාල බිසව කතා නායිකාව හා සම්බන්ධ පුරාවෘත්තය අන්තර්ගත ශාන්ති කර්මය වනුයේ,

1) සන්නි යකුම 2) කිරි මඩුව 3) සූනියම් යාගය

4) රිද්දි යාගය 5) කොහොඹා කංකාරිය (..........)

24) මඩු ශාන්තිකර්මවල දී ප්‍රධා වශයෙන් ම පුද ලබන දෙවියන් වන්නේ,

1) පත්තිනි ය. 2) මංගර ය. 3) අයියනායක ය.

4) දැඩිමුණ්ඩ ය. 5) සමන් දෙවියන් ය. (..........)

25) යාග භූමියේ සැරසිල්ලක් ලෙස පිල්ලු විදියක් නිර්මාණය කරන්නේ කුමන ශාන්ති කර්මයේ ද ?

1) රටයකුම 2) මහසොහොන් සමයම 3) සූනියම් යාගය.

4) කිරිමඩුව 5) සන්නියකුම (..........)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

26) ''බඩහැල මලේ අරගෙන පලයං බොක්ක, නොදෝකිං හුච්චි අම්මා'' ප්‍රකාශයන්ට ගැළපෙන පිළිතුර වන්නේ,

1) කොහොඹා කංකාරිය හා දහඅට සන්නිය
2) වඩිග පටුන හා රිද්දි යාගය
3) සූනියම් යාගය හා ගම්මඩු
4) කොහොඹා කංකාරිය හා රිද්දි යාගය
5) කොහොඹා කංකාරිය හා දෙවොල් මඩුව (..........)

27) තොරණ් හතකින් සමන්විත ''නවමල්පාය'' නම් වූ රංගභූමිය භාවිතා කරන්නේ,

1) දෙවොල් මඩුවේ දී ය.
2) ගම් මඩුවේ දී ය.
3) සූනියම් මඩුවේ දී ය.
4) දහඅට සන්නියේ දී ය.
5) රටයකුමේ දී ය. (..........)

28) වසවර්ති මාරයා මහාසම්මත රජු යුධ පිණිස ගිය අවස්ථාවේ දේවියගේ කුටියට ඇතුල්වීමට ගත් උත්සාහය අසාර්ථක වීම නිසා කෝපයට පත්වී අවීචි මහා නිරයෙන් ගිනි කඳක් ද, විෂ පොළගෙකුගේ වේෂයක් ද මැවූ බව කියන ශාන්ත කර්මය වන්නේ,

1) දහඅට සන්නියයි.
2) සූනියම් යාගයයි.
3) රට යකුමයි.
4) ගරා යකුමයි.
5) මහසොහොන් සමයමයි. (..........)

29) පහතරට ශාන්තිකර්ම අතරින් ස්ත්‍රීන් සඳහා පමණක් කෙරෙන ශාන්ති කර්මය වන්නේ,

1) කළුකුමාර සමයමයි
2) රිද්දි යාගයයි.
3) කිරි කොරහේ පිදීමයි.
4) දහඅට සන්නියයි.
5) සූනියම් යාගයයි. (..........)

30) ඇත් බන්ධනය හා මී බන්ධනය ඇතුළත් වන්නේ,
පහත දැක්වෙන කවර ශාන්තිකර්මයට ද?

1) සන්නි යකුම
2) දෙවොල් මඩුව
3) පුනා මඩුව
4) රිද්දි යාගය
5) කොහොඹා කංකාරිය (..........)

31) ශ්‍රී ලංකාවේ මඩු ශාන්තිකර්ම සම්බන්ද නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1) මඩු ශාන්තිකර්මවල දෙවියන්, යකුන් හා ග්‍රහයෝ පුද ලබති.
2) ප්‍රධාන වශයෙන් පූජාවට පාත්‍ර වන්නේ නාථ දෙවියා ය.
3) ගම් මඩුවක් පැවැත්වීමේ මූලික අරමුණ කොවිඩ්වලින් ආරක්ෂා වීමයි.
4) මඩු ශාන්තිකර්ම බහුලව දක්නට ලැබෙන්නේ දකුණු පළාතේ ය.
5) පූජාවකට වස්දොස් එක්කොට ගව හිසක ගසා බිඳීම පුනා මඩුවකදී සිදු වේ. (..........)

32) කොහොඹා කංකාරියේ එන ගබඩා කොල්ලය නම් අංගය පැවැත්වීමේ අරමුණ කුමක්ද ?

1) වස් දොස් දුරු කිරීම.
2) හාස්‍යය මතුකොට දැක්වීම.
3) ගම්වැසියන් එකතුකළ ආහාර ද්‍රව්‍ය බෙදා දීම.
4) ශාන්තිකර්මයක් අවසන් කිරීමට පෙර සියලු ආම්පන්න ගිනි තැබිය යුතුවීම.
5) දෙවියන්ට වෙන් කළ ද්‍රව්‍ය නරයන් අතට පත් නොවනු පිණිස සිදු කරයි. (..........)

33) කුවේණි වේදිකා නාට්‍යයට යොදාගත් පුරාවෘත්තය අන්තර්ගත ඓතිහාසික කෘතීන් වන්නේ,

1) මහාවංශය, කුවේණි අස්න, රාජාවලිය
2) රාජාවලිය, බුත්සරණ, ධර්ම ප්‍රදීපිකා
3) රාජාවලිය, සුභාෂිතය, බුදුගුණ අලංකාරය
4) කුවේණි අස්න, බුත්සරණ, සද්ධර්මාලංකාරය
5) බුදුගුණ අලංකාරය, සුභාෂිතය, බුත්සරණ (..........)

34) කුවේණි නාට්‍යය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1) රාජරත්නාකරයෙහි කුවේණි පුරාවෘත්තය අන්තර්ගත ය.
2) පුරාවෘත්තයට අනුව කුවේණිය යක්ෂ ගෝත්‍රික මිනිස් කතකි.
3) කුවේණි නාට්‍යය ප්‍රථම වරට නිෂ්පාදනය වූයේ 1960 දී ය.
4) එහි දඩයක්කරු ගේ චරිතය රඟපෑවේ විජයරත්න වරකාගොඩ ය.
5) කොහොඹා කංකාරියට හා වලියක් මංගල්‍යයට කුවේණි පුරාවෘත්තය පදනම්ව ඇත. (..........)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

35) ''ලෝක ඉතිහාසයේ මිනිසුන්ගේ ගල් මුගුරු පාර කාල මැරුණු මුල් ම පව්කාරිය තමා කුවේණි''
කුවේණි නාට්‍යයේ මෙසේ පවසන්නේ කවුද ?

1) නීතිඥයා   2) දිසාලා   3) II නීතිඥයා
4) ජීවහත්ත   5) දඩයක්කරු   (..........)

36) කුවේණි නාට්‍ය රචකයා කුවේණිය අද්‍යතන උසාවියක් හමුවට පමුණුවන හේතුව පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1) ඇයට ඉතිහාසයේ ඉටුනොවුණු සාධාරණය ඉටු කිරීම සඳහා ය.
2) වර්තමාන සමාජයේ යුක්තිය පසිඳලන්නේ උසාවිය නිසා ය.
3) ඉතිහාසය සාවද්‍ය බව ඔප්පු කිරීම සඳහා ය.
4) සත්‍ය සොයා ගැනීමට ඇති එකම මාර්ගය එය නිසා ය.
5) අවම වශයෙන් කුවේණියගේ දරුවන්ට යුක්තිය ඉටු කිරීම සඳහා ය. (..........)

37) කුවේණි නාට්‍යයේ රංග ශෛලිය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1) එය ගීත නාටයක් බව ය.
2) එය ඔපෙරා ශෛලිය අනුව නිර්මාණය කර ඇති බව ය.
3) එය ලෝකධර්මි හා නාට්‍යධර්මි මිශ්‍ර ශෛලියකින් නිර්මිත බව ය.
4) එය ලෝකධර්මි නාට්‍යයක් ලෙස හැඳින්වීම වඩාත් සාධාරණ බව ය. (..........)

38) හෙන්රි ජයසේනයන්ගේ කුවේණි නාට්‍යයේ දඩක්කරුගේ චරිතය රඟපෑ නළුවා කව්ද ?

1) විජේරත්න වරකාගොඩ   2) ෆිලික්ස් ප්‍රේමවර්ධන   3) හෙන්රි ජයසේන
4) සැන්ට්න් ගුණවර්ධන   5) විජය නන්දසිරි   (..........)

39) ''ගලින් ගල ගටාලා - අන්ධකාරේ අතීතේ ගිනිපුපුරු මැවූ ඒ .....'' කුවේණි නාට්‍යයේ එන ඉහත ගීතය ගයන්නේ කවරෙක්ද?

1) ගායකයෝ   2) පූරක   3) දඩයක්කරු
4) ජීවහත්ත   5) දිසාලා   (..........)

40) විජය - කුවේණි පුවත අන්තර්ගත ඓතිහාසික නොවන මූලාශ්‍රය කුමක්ද ?

1) මහාවංශය   2) වංසත්ථප්පකාසිනිය   3) රාජාවලිය
4) කුවේණි අස්න   5) දීපවංශය   (..........)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

# II කොටස

● උපදෙස් :

A සහ B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## A කොටස

01) i) නාට්‍යමය ලක්ෂණයන්ගෙන් සමන්විත බෞද්ධ පූජාකර්ම හතරක් නම් කරන්න. (ල. 04)

ii) ඔබ ඉහත නම් කළ බෞද්ධ පූජාකර්මයක් පවත්වන ආකාරය පැහැදිලි කරන්න. (ල. 05)

iii) බෞද්ධ පූජාකර්මවල අන්තර්ගත නාට්‍යමය ලක්ෂණයන් උදාහරණ සහිතව දක්වන්න. (ල. 06)

02) i) ශ්‍රී ලංකාවේ උඩරට හා පහතරට සම්ප්‍රදායන්ට අයත් ප්‍රධාන ශාන්තිකර්ම දෙක බැගින් ලියා දක්වන්න. (ල. 04)

ii) උඩරට සම්ප්‍රදායට අයත් ප්‍රධාන ශාන්ති කර්මයක් පැවැත්වීමේ හේතු (අරමුණු) පහක් දක්වන්න. (ල. 05)

iii) ඉහත දැක්වූ ශාන්ති කර්මයේ අන්තර්ගත නාට්‍යමය පෙළපාළි හතරක් නම් කොට ඉන් එකක් පවත්වන ආකාරය විස්තර කරන්න. (ල. 06)

03) i) කුවේණි පුරාවෘත්තය අන්තර්ගත සාහිත්‍යමය මූලාශ්‍රයක් නම් කරන්න. (ල. 02)

ii) පුරාවෘත්තයේ දැක්වෙන කුවේණිය හා නාට්‍යයෙහි දැක්වෙන කුවේණිය අතර වෙනස්කම් දෙකක් දක්වා නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ල. 06)

iii) ''සදාකාලික ගැහැණිය'' ලෙස නාට්‍ය රචකයා කුවේණිය හඳුන්වා ඇත්තේ මන්දැ යි විස්තර කරන්න. (ල. 07)

## B කොටස

04) i) රටයකුම යාගය පැවැත්වීමේ ප්‍රධාන අරමුණු හතරක් ලියන්න. (ල. 04)

ii) රටයකුම අන්තර්ගත විරාම රංගනයන් 3 ක් නම්කොට එකක් පවත්වන ආකාරය පැහැදිලි කරන්න. (ල. 04)

iii) මෙහි අඩංගු නාට්‍යමය ලක්ෂණයන් 5 ක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 07)

05) i) කුවේණි නාට්‍යයේ ගායක කණ්ඩායමෙන් සිදුවන කාර්යභාරයන් දෙකක් පැහැදිලි කරන්න. (ල. 05)

ii) කුවේණිය සංවේදී ගැහැණියක ලෙස ප්‍රේක්ෂකයාට හඳුන්වාදීමට නාට්‍යකරු කවර නාට්‍යමය උපක්‍රම භාවිත කළේදැයි විමසන්න. (ල. 05)

iii) කුවේණි නාට්‍යයේ එන කුවේණි චරිතය භූමිකා පිළිබඳ සාකච්ඡාවක් කරන්න. (ල. 05)

06) i) නාට්‍යමය විචාරයේ දී සලකා බැලිය යුතු මූලික කරුණු 5 ක් නම් කරන්න. (ල. 05)

ii) ඉහත i) හි සඳහන් කළ එක් කරුණක් ගෙන එහි වැදගත්කම පහදන්න. (ල. 05)

iii) කුවේණි නාට්‍ය පිළිබඳ විචාරයක් ලියන්න. (ල. 05)

SLGURU.LK
For Educational Purpose Only

“I am still learning.” — Michelangelo

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

දෙවන වාර ඇගයීම - 2025
**Second Term Evaluation - 2025**
**இரண்டாம் தவணைப் பரீட்சை** - 2025

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය Grade | 12 | විෂය Subject | නාට්‍ය හා රංගකලාව | කාලය Time | පැය 03 |
| නම **பெயர்** **Name** | | | | | |

II පත්‍රය

I කොටස

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

01. නාට්‍ය කලාවේ මූලික අරමුණ වන්නේ,
    (1) උපදේශයක් හෝ දැනුමක් ලබා දීමයි.
    (2) මානසික විශ්‍රාන්තිය ලබා දදීමයි.
    (3) ප්‍රේක්ෂකයාට සෞන්දර්යාත්මක වින්දනයක් ලබා දදීමයි.
    (4) නරඹන්නන්ගේ පරිකල්පන ශක්තිය දියුණු කිරීමටය.
    (5) සමාජය යහමගට යැවවීමයි

02. නාට්‍ය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කල අපරදිග විද්වතුන් දෙදෙනෙක් වන්නේ,
    (1) ධනංජය හා ඇරිස්ටෝටල් ය.
    (2) භරතමුණි හා බර්නාඩ්ෂෝ ය.
    (3) ධනංජය හා භරතමුණි ය.
    (4) ඇරිස්ටෝටල් හා අභිනවගුප්ත ය.
    (5) ඇලඩයිස් නිකෝල් හා බර්නාඩ්ෂෝ ය.

03. වේදිකා නාට්‍යයක ආනුෂංගික අංග පිළිබඳ නිවැරදි ප්‍රකශය තෝරන්න.
    (1) ආනුෂංගික අංග නාට්‍යයක ප්‍රේක්ෂාවට බලපෑමක් නැත.
    (2) රංගාලෝකය මීට අයත් නොවේ.
    (3) ආනුෂංගික අංග උපරිම වශයෙන් යෙදීමෙන් නාට්‍යයක් සාර්ථක වේ.
    (4) පෙරදිග සංකල්පය අනුව ආහාර්ය අභිනයට අයත් වේ.
    (5) අධ්‍යක්ෂවරයාගේ මැදිහත්වීම අවශ්‍ය නොවේ.

04. ශෝකාත්මක නාට්‍යයක නතාවස්තුව ප්‍රධාන වශයෙන් දෙආකාර බව ඇරිසටෝටල් පවසා ඇත. එහි ආකාර දෙක වන්නේ,
    (1) ප්‍රේක්ෂාව හා සංගීතයයි.
    (2) චින්තනය හා ස්මරණ ශක්තියයි.
    (3) සරල හා සංකීර්ණයයි.
    (4) ප්‍රත්‍යක්ෂය හා පේක්ෂාවයි
    (5) අවශ්‍යතාවය හා සම්භාව්‍යතාවයයි.

05. කෙටි නාට්‍ය සබම්න්ධ නිවැරදි පිළිතුර තෝරන්න.
    (1) ජවනිකා වලට නොබෙදේ.
    (2) රංගකාලය සලකා කළ වර්ගීකරණයකි.
    (3) අංක කිහිපයක් ඇත.
    (4) රචනය සඳහා විශේෂ ශිල්පීය ඥානයක් අවශ්‍ය නොවේ.
    (5) කෙටි නාට්‍ය සඳහා කෙටි කතා යොදාගැනීම අනුචිතය.

SLGURU.LK For Educational Purpose Only

SLGURU.LK

06. ග්‍රීක ශෝකෝත්පාදක වීරයාගේ භාග්‍ය පරිවර්තනය සඳහා ඇරිස්ටෝටල් යොදාගත් පාරිභාෂිත පදය කුමක් ද?

(1) අනාවරණය
(2) ප්‍රත්‍යාවර්තනය
(3) කතාර්සිස්
(4) ප්‍රත්‍යාභිඥානය
(5) ආකුලීකරණය

07. පින්තූර රාමු වේදිකාවේ පර්යාවලෝකනය පෙන්වවීමට උපකාරී වන්නේ,

(1) ප්‍රධාන තිරය
(2) මැදතිරය
(3) ගගනිකාව
(4) උඩතිරය
(5) පැතිතිරය

08. ප්‍රේක්ෂාව හා ප්‍රෙක්ෂකයා සම්බන්ධ නිවැරදි වන්නේ,

(1) වේදිකාවේ ප්‍රෙක්ෂාව මවනු ලබන්නේ ප්‍රේක්ෂකයාය.
(2) ප්‍රේක්ෂාව වූ කලි වේදිකාවේ පසුතලය හා රංගාලෝකයයි.
(3) මංගල දර්ශනය තුළ ප්‍රෙක්ෂාවක් නැත.
(4) ප්‍රෙක්ෂාව මොහොතින් මොහොත වෙනස් වේ.
(5) ප්‍රේක්ෂක ප්‍රතිචාර මත ප්‍රේක්ෂාව වෙනස් වේ.

09. වේෂභූෂණ හා අංගරචනා හා ශිල්පය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය

(1) සරල නොවිය යුතුය.
(2) නාට්‍යයේ තේමාවට හා ශෛලියට පමණක් සීමා නොවිය යුතුය.
(3) උපරිමව යෙදිය යුත්තේ ලෝකධර්ම සම්ප්‍රදායේදීය.
(4) චරිතයේ ලක්ෂණ යටපත් නොවන පරිදි සිදුකල යුතුය.
(5) එම ශිල්පීන්ගේ කාර්යය රූපලාවන්‍ය ශිල්පියෙකුගේ කාර්යය හා සාමන්‍යය

- **ප්‍රශ්න අංක 10 සිට 15 දක්වා නොගැලපෙන පදය තෝරන්න.**

10. (1) දෙබරු (2) මණ්ඩුකයෝ (3) කුරුල්ලෝ (4) හිපොලිටස් (5) වලාකුළු
11. (1) ප්‍රේක්ෂාලය (2) පැරඩෝස් (3) මේකිස් (4) ඔරිස්ට්‍රාව (5) දොබකරය
12. (1) යොමුපහන් (2) ටාරා පහන් (3) වර්ණ චක්‍රය (4) අල්ට්‍රා වයලට් පහන (5) ස්ට්‍රිප් ලාම්පු
13. (1) පියානෝව (2) නත්තල් ගස (3) මැකරුන් (4) ඒප්‍රනය (5) කුරුසය
14. (1) සියුස් (2) දියෝනියස් (3) ඇත්නා (4) ඇපලෝ (5) සොලෝන්
15. (1) මෙන්ෂන් (2) උමං දොරටු (3) ශ්‍රේණි නාටක (4) එපිඩෝරන්ස් (5) මර්මුලියන්

16. යථාර්ථයේ පියා ලෙස විචාරකයන් හඳුන්වන නාට්‍යකරුවා කවුද?

(1) යුරිපිඩියස්
(2) ඊස්කිලස්ස
(3) සොෆොක්ලිස්ය
(4) ඇරිස්ටොපානිස්ස
(5) මෙන්න්ඩ්‍රොස්ස

17. ග්‍රීක ඛේදාන්ත නාට්‍යයක අවසානයට රංග භූමියෙන් පිටව යන්නේ කවුද?

(1) ගායන වෘන්දය
(2) වීරයා
(3) පණිවිඩකරු
(4) ගායන නායකයා
(5) පූජකවරයා

18. ග්‍රීක කොමඩි සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,

(1) කොමඩියේදී නළුවන් වෙස්මුහුණු පැළැන්දේ නැත.
(2) කොමඩියේ අරමුණ උත්තුංග ක්‍රියාවක් අනුකරණය කිරීමයි.
(3) ගායන වෘන්දය විසිපස් සෙනෙකුගෙන් සමන්විතය.
(4) කොමඩි නාට්‍ය පිළිබඳ නාට්‍ය ශාස්ත්‍රයේ ඒ තරම් අවධානයක් යොමුකර නැත.
(5) ශෝකාත්ම නාට්‍යයක මෙන් කොමඩියට නිශ්චිත ආකෘතියක් නොමැත.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

19. ග්‍රීක ශොකාත්පාදකයේ වීරයා භාග්‍ය පරිවර්තනය සඳහා ඇරිස්ටෝටල් යෙදූ පාරිභාෂිත පදය කුමක් ද?
    (1) ප්‍රත්‍යාවර්තනය (2) ප්‍රත්‍යාභිඥානය (3) කතාර්සිස් (4) අනාවරණය (5) ආකුලීකරණය

20. ළදරු ඊඩිපස් කොරින්තයේ ගොපල්ලාට භාර දුන්නේ කුමන ස්ථානයකදීද?
    (1) ඔලිම්පස් කන්දේදී (2) සිතීරියන් කඳුවැටියේ දී (3) ඩෙල්ෆ් කඳු පාමුල (4) ෆර්නේසස් කඳුවැටියේ (5) ඉස්මේනස් නදීතීරයේ

21. ඊඩිපස් නාට්‍යයේ වේදිකාව මත රඟදක්වා පෙන්වන අවස්ථාවක් විය හැක්කේ
    (1) ඊඩිපස් කලකිරී නෙත් අඳකර ගැනීමය
    (2) ඊඩිපස් තුන්මං හන්දියට පැමිණීම
    (3) ස්ෆින්ක්ස් ප්‍රහේලිකා විසඳීමයි.
    (4) යොකෙස්ටා ඊඩිපස් වෙතින් ශෝකීව නික්ම යයි.
    (5) ඊඩිපස් අතින් ක්ෂණික කෝපයෙන් ලායියුස් රජු ඝාතනය වීම.

22. පශ්වාද් දෘෂ්ටිකත්‍ය රීතිය මඟින් සොෆොක්ලීස් අපේක්ෂා කළ අරමුණ වූයේ
    (1) සෑම සිදුවීමක්ම වේදිකාව මතට ගෙන ඒමයි.
    (2) සිද්වීම් අනුපිළිවෙලින් ඉදිරිපත් කිරීමය.
    (3) ප්‍රේක්ෂක කුතුහලය රඳවා ගැනීමය.
    (4) නළුවන් සංඛ්‍යාව සීමා කිරීමයි.
    (5) ගායන වෘන්දයේ කාර්යභාරය පහසු කිරීමය.

23. ග්‍රීක නාට්‍ය රචක සොෆොක්ලිස් පිළිබඳ නිවැරදි වන්නේ.
    (1) උපත ලැබුවේ ක්‍රි:පූ: 497
    (2) කිසිවිටක තම නාට්‍යකට ප්‍රථම ස්ථානය
    (3) හිමිකර ගත්තේ නැත.
    (4) ගායන වෘන්දය 12 දක්වා ය.
    (5) ජ්‍යෙෂ්ඨම ග්‍රීක යොකාන්ත නාට්‍ය රචකයාය.

24. මම කැටුව ආවෙමි. උන් දෙදෙන දනිමි. ඔබ තුඹ කෙතරම් සෙනෙහෙවන්ත දැයි ඊඩිපස් නාට්‍යයේ එන ඉහත සංවාද ඛණ්ඩය පවසන්නේ කවුද?
    (1) පූජකයා (2) ඊඩිපස් (3) ගොපල්ලා (4) ක්‍රොයෝන් (5) යොකෙස්ටා

25. ග්‍රීක මැජඩි නාට්‍යයක මූලිකාංග හය ඇරිස්ටෝටල් පෙළගස්වා ඇති අනුපිළිවෙල වන්නේ,
    (1) වස්තුව, චින්තනය, චරිත, ප්‍රේක්ෂාව, සංගීතය, වාග් විලාසය
    (2) වස්තුව, චරිත, චින්තනය, වාග් විලාසය, ප්‍රේක්ෂාව, සංගීතය
    (3) චරිත, වස්තුව, චින්තනය, ප්‍රෙක්ෂාව, වාග් විලාසය, සංගීතය
    (4) වස්තුව, චරිත, වාග්විලාසය, චින්තනය, පේක්ෂාව, සංගීතය
    (5) චරිත, වස්තුව, චින්තනය, සංගීතය, පේක්ෂාව, වාග් විලාසය

26. මුල්ම මධ්‍යකාලීන ජන වන්දනා නාට්‍ය ලෙස සැලකෙන්නේ
    (1) පළමු එඬේරාගේ කථාව
    (2) සකලජනය
    (3) නොආගේ කථාව
    (4) දෙවන එඬේරාගේ කතාව
    (5) මරියවරුන් තිදෙනාගේ කථාව

27. මධ්‍යකාලීන යුරෝපයේ චක්‍ර නාට්‍යයකට අදාළ නොවන අංගය වන්නේ,
    (1) රථ වේදිකාව (2) බහු වේදිකාව (3) යන්ත්‍ර සූත්‍ර භාවිතය (4) සාන්තුවර කතාපුවත් (5) පූජක නළුවෝය.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

28. රූකඩ ගෙදර නාට්‍යයේ ප්‍රබලතම සංකේතයක් වන්නේ,
(1) ගිනි උදුන
(2) කලු කුරුසය
(3) තරන්තලා නැටුම
(4) මැකරුන්
(5) පියානෝව

29. රූකඩ ගෙදර නාට්‍යයේ දෙවන අංකයේ දැකිය හැකි සිදුවීමක් වන්නේ,
(1) නෝරා හා ටෝවල්ඩ්ගේ ප්‍රතිමත් ජීවිතය
(2) නෝරා රිදදීකාසි 1200 ක් ණයට ගැනීම
(3) හෙල්ටර්ගේ අසනීපය සඳහා ඉතාලියට යෑම
(4) කොග්ස්ට්‍රඩ් රැකියාවෙන් නෙරපීම දක්වා ලිපිය හෙල්මර්ට යැවීම
(5) නෝරා හෙල්මර් අතහැර නිසවින් පිට වී යාම

30. රූකඩ ගෙදර නාට්‍යයේ කොග්ස්ට්‍රඩ් නෝරාගෙන  කරන ඉල්ලීම වන්නේ,
(1) ක්‍රිස්ටීන් රැකියාවට නොගන්නා ලෙසයි.
(2) සෙල්ලම් බාලට නොයන ලෙසය.
(3) තමා රැකියාවෙන් ඉවත් නොකරන්නැයි හෙල්මර්ට බලකරන ලෙයසි.
(4) තමා පැමිණි බව හෙල්මර්ට නොකියන ලෙයසි.
(5) ණය මුදල ගැන ක්‍රිස්ටීන් ට පවසන ලෙසය.

31. "ජීවත් වෙන්නට ශෝකයත් දුකත් තරම්වත් ඉතුරු කළේ නෑ." රූකඩ දෙර නාට්‍යයේ එම ප්‍රකාශය කරන්නේ කවුරුන් කා හටද?
(1) හෙල්ම විසින් රන්ක්ට
(2) නෝරා විසින් හෙල්ම ට
(3) රන්ක් විසින් කොෆ්ස්ට්‍රයිඩ් ට
(4) කොග්ස්ට්‍රඩ් විසින් ලින්ඩේ ට
(5) ලින්ඩේ මිය විසින් නොරා ට

32. රංග වින්‍යාසය යනු
(1) රූපණ ශිල්පීන්ගේ හැසිරීම් පාලනය කිරීමය.
(2) නාට්‍යයක සිදුවීම් මුල මැද අග ගලපා ඉදිරිපත් කිරරීමයි.
(3) රංග භූමිය මත මොහොතින් මොහොත මැවෙන දර්ශනයයි.
(4) නිෂ්පාදනයේ දී රංග භූමිය හා නළු නිළියන් සම්බන්ධව කටයුතු කිරීමයි.
(5) අවස්ථාවට හෝ සිදුවීමකට අවශ්‍ය පරිදි චලන හා රිද්ම මනාව පෙළගැස්වීමයි

33. අනුකරණය යන්නට අදාළ පහත සඳහන් ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය වනුයේ
(1) ග්‍රීක ශෝකජනක නාට්‍යයකින් අනුකරණය කරනුයේ පුද්ගල චරිතයයි
(2) ග්‍රීක භාෂාවේ අනුකරණය මිමෙසිස් ලෙස හැඳින්වේ.
(3) පෙරදිග නාට්‍ය කලාවේදී අනුකරණය පිළිබඳ සඳහන් වේ.
(4) ඇරිස්ටෝටල් අනුකරණය පැහැදිලිව විග්‍රහ කොට ඇත.
(5) අනුකරණය මිනිස් ස්වභාවයේ මූලික ලක්ෂණයකි.

34. අවස්ථා ප්‍රතිනිර්මාණය සඳහා වැඩි අවබෝධයක් ලබා දෙන්නේ
(1) අංගරචනා ශිල්පියා
(2) රංග වින්‍යාසය
(3) රංග විධානයන්ය.
(4) වේදිකා පරිපාලනය
(5) රංගාලෝක ශිල්පියා

35. සංගීතය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සංගීතය නොමැති වේදිකා නාට්‍යයක් නැත.
(2) සංගීතය ආහාර්ය අභිනයට පමණක් අයත් වේ.
(3) කුවේණි නාට්‍ය ශෝකී ස්වභාවයකින් යුතු හෙයින් සංගීතය භාවිතා කිරීම උචිත නැත.
(4) අනුශංගික අංගයක් ලෙස නොසැලකේ.
(5) ඇරිස්ටෝටල් ශෝකජනක නාට්‍යයේ සංගීතයට ප්‍රමුඛත්වයක් දී නැත

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

36. ළමා නාට්‍ය කලාවට අදාළ පහත් සඳහන් වරණවලින් නිවැරදි වරණය තෝරන්න.
   (1) ශ්‍රී ලංකාවේ ළමා නාට්‍ය සඳහා රාජ්‍ය මට්ටමේ සම්මාන උළෙලක් නොපැවැත්වෙයි.
   (2) ළමා නාට්‍යයට ඊට විශේෂ වූ ගති ලක්ෂණ අවශ්‍ය නැත.
   (3) ළම ා නාට්‍ය නිර්මාණයේදී ඔවුන්ගේ හැකියා, සිතුම් පැතුම්, චර්යා, අධ්‍යයනය කළ යුතුවේ.
   (4) ළමා නාට්‍යයක් සතුටුදායක අවසානයකින් යුක්ත විය යුතු නැත.
   (5) වයස් කාණ්ඩවලට ආවේණික චර්යා රටා ළමා නාට්‍ය සඳහා වැදගත් නොවේ.

37. ලෝකයේ භාවිතයේ අරමුණක් නොවන්නේ,
   (1) නාට්‍ය ජවනිකා වෙන් කිරීම.
   (2) වේදිකාව මත තත්ත්වානුරූපී මායාව ඇතිකරලීම.
   (3) තේමාව, ශෛලිය, යුගය පිළිබඳ සැලකිලිමත් වීම.
   (4) රංගයෙහි අර්ථය තීව්‍ර කරන භාෂාවක් ලෙස භාවිත කිරීම.
   (5) වේදිකාවේ ගැඹුර පෙන්වීම

38. ග්‍රීක ශෝකාත්මක නාට්‍ය වල චරිත්යන්ගේ චිත්ත අභ්‍යන්තරය හෙළි කිරීමට භාවිත කළ උපක්‍රමයක් වන්නේ
   (1) සංකේත යොදා ගැනීම.
   (2) පණිවුඩ කරුවෙක් යොදාගැනීම.
   (3) ගායන වෘන්දය යොදාගැනීම.
   (4) ආත්ම භාෂණ භාවිතය
   (5) නළුවන්ගේ මුවින් ප්‍රකාශ කිරීම.

39. "මිලිටොස් ලුණ්ටනය" නම් ග්‍රීක නාට්‍ය රචනා කරන ලද්දේ
   (1) ඇරිස්ටොෆානිස්
   (2) ප්‍රටීනස් ග
   (3) පෙරික්ලීස්
   (4) ෆ්රූනිබොස්
   (5) බොයිරිලොස්

40. නාට්‍ය විචාරයට අදාල නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) නාට්‍ය විචාරය පිළිබඳ පැරණිතම ග්‍රන්ථය රචනා වූයේ ශෝක ජනක නාට්‍යවලට අදාළවයි.
   (2) නාට්‍ය විචාරය පිළිබඳ පිළිගත් සිද්ධාන්ත කිසිවක් නැත.
   (3) නාට්‍ය විචාරකයා හොඳ රසිකයෙක් හා ප්‍රේක්ෂකයෙක් විය නොහැක.
   (4) නාට්‍ය කලාවේ අභිවෘද්ධිය සඳහා විචාර කලාවක් අත්‍යාවශ්‍යය.
   (5) නාට්‍ය විචාරය අපරදිගට පමණක් සීමා වූ මතවාදයකි

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

II පත්‍රය

A කොටස

- A කොටසින් ප්‍රශ්න 2 ක් හා B කොටසින් ප්‍රශ්න2 ක් තෝරා ප්‍රශ්න 4කට පමණක් පිළිතුරු ලියන්න.

01. (i) ප්‍රාසාංගික කලාවේ නිර්ණායක හඳුන්වන්න. (ල.-4)
(ii) සිනමාව හා ප්‍රාසාංගික කලාව අතර වෙනස පැහැදිලි කරන්න. (ල.-5)
(iii) ප්‍රාසාංගික කලා අතර නාට්‍යයට හිමිවන ස්ථානය පැහැදිලි කරන්න. (ල.-6)

02. (i) ග්‍රීක නාට්‍ය රංගභූමිය ඇඳ නම් කරන්න. (ල.-4)
(ii) එහි අන්තර්ගත කොටස් දෙකක භාවිතය පිළිබඳ පැහැදිලි කරන්න. (ල.-5)
(iii) ග්‍රීක ට්‍රැජඩි නාට්‍යයක රංග ශෛලය ඔබ දන්නා ග්‍රීක නාට්‍යයක් නිදසුන් කරගනිමින් විස්තර කරන්න.(ල.-6)

03. (i) ඊඩිපස් රජ නාට්‍යයෙහි ඇතුළත් චරිත හතරක් නම් කරන්න. (ල.-4)
(ii) ඊඩිපස් රජ නාට්‍යයට පසුබිම වූ පුරාවෘත්ත කතාව පැහැදිලි කරන්න. (ල.-5)
(iii) ඊඩිපස් නාට්‍ය පෙළ ඇසුරුකරගෙන ගායන වෘන්දයේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ල.-6)

B කොටස

04. (i) රුකඩ ගෙදර නාට්‍යයේ කරන්තලා නැටුම තුළින් අනාවරණය වූයේ කුමක් ද? (ල.-4)
(ii) පුරුෂාධිපත්‍යයෙන් යුතු සමාජයේ හෙල්ම තුළ තිබූ ගති ලක්ෂණ දක්වා, එම ගති ලක්ෂණ ඉස්මතු වූ අවස්ථා දක්වන්න. (ල.-5)
(iii) නෝරා හෙල්මට සැඟවූ රහස කුමක්දැයි උදාහරණ සහිතව විස්තර කැන්න. (ල.-6)

05. (i) වේදිකා නාටාට්‍යයක යොදා ගන්නා ආනුශංගික 4 ක් සඳහන් කරන්න. (ල.-4)
(ii) ඉන් වර්ණ සම්බන්ධ කරගන්නා ආනුෂංගික කලා අංග දෙකක් විස්තර කරන්න. (ල.-5)
(iii) නාට්‍යධර්මී නාට්‍යයක හා ලෝකධර්මී නාට්‍යයක පසුතල භාවිතය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ල.-6)

06. (i) යුරෝපයේ ජන වන්දනා නාට්‍ය බිහිවීමට බලපෑ ආගමික පසුබිම පැහැදිලි කරන්න. (ල.-4)
(ii) ජන වන්දනා නාට්‍ය ප්‍රභේද නම්කොට ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න. (ල.-5)
(iii) ජන වන්දනා නාට්‍යවල රංග ශෛලිය පැහැවිලි කරන්න. (ල.-6)

SLGURU.LK
For Educational Purpose Only

“I am still learning.” — Michelangelo

Visit SLGURU.LK to download papers and notes.